# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## 2022 අප්‍රේල් මස 29 වන දින

## II වන කොටස

## අතිරේකය

(2022.05.04 දින නිකුත් කරන ලදී)


# ශ්‍රී ලංකා විදුලිබල (සංශෝධන)

**2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

විදුලිබල අමාත්‍යතුමාගේ නියමය පරිදි පළකරන ලදී


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකි ය.

**මිල : රු. 12.00** **තැපැල් ගාස්තුව : රු. 15.00**

මෙම ගැසට් අතිරේකය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## නීතිය බලපෑමේ ප්‍රකාශය

***2 වන වගන්තිය*** : මේ වගන්තිය මගින් (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 8 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ යම් තැනැත්තකුට විදුලිබලය සැපයීම සඳහා වූ ලංසු තැබීමේ ක්‍රියාවලියකට සහභාගී වීමට හැකියාව ලබා දීමයි.

***3 වන වගන්තිය*** : මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ,-

(අ) යම් තැනැත්තකුට විදුලිබලය උත්පාදනය කිරීම පිණිස උත්පාදනය කිරීමේ බලපත්‍රයක් නිකුත් කිරීම සඳහා ඉල්ලුම් කිරීමට සුදුසුකම් ලබාදීම වේ; සහ

(ආ) යම් තැනැත්තකුට උත්පාදන ධාරිතාව මෙ.වො. 25 ඉක්මවා සහ අභිබවා විදුලිබලය උත්පාදනය කිරීමේ බලපත්‍රයක් නිකුත් කිරීම සඳහා ඉල්ලුම් කිරීමට ඇති සීමා ඉවත් කිරීම සහ උත්පාදන ධාරිතාව පිළිබඳ යම් සීමා නියම කිරීමකින් තොරව ඕනෑම තැනැත්තකුට ඒ සඳහා ඉල්ලුම් කිරීමට අවසර ලබා දීම වේ.

***4 වන වගන්තිය*** : මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 43 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ,-

(අ) 9 වන වගන්තියේ (1) වන උපවගන්තියට කරන ලද සංශෝධනයට අදාළ වූ ආනුෂංගික සංශෝධනයක් ලෙස එහි (3) වන උපවගන්තිය ඉවත් කිරීම; සහ

(ආ) වැඩිදියුණු කළ යුතු යම් පවත්නා උත්පාදන පිරියතක් සඳහා ද අතුරු විධානයේ විධිවිධාන අදාළ වීම පුළුල් කිරීම සහ ඒ උපවගන්තියේ ඇති මඟ හැරීමක් නිවැරදි කිරීම ද වේ.

එල්.ඩී.— ඕ. 8/2019

**2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

ලුහුඬු නාමය

**1.** මේ පනත 2022 අංක දරන ශ්‍රී ලංකා විදුලිබල (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2009 අංක 20 දරන පනතේ 8 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම

**2.** (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 8 වන වගන්තිය මෙයින් ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:-

"විදුලි බලය සැපයීම සඳහා වූ ලංසු තැබීමේ ක්‍රියාවලියකට සහභාගී වීම

8. යම් තැනැත්තකුට විදුලි බලය උත්පාදනය කිරීම සඳහා වූ ලංසු තැබීමේ ක්‍රියාවලියකට සහභාගිවීමට හැකි ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය සංශෝධනය කිරීම

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එහි (1) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්:-

"(1) යම් තැනැත්තකු විදුලි බලය උත්පාදනය කිරීම පිණිස උත්පාදනය කිරීමේ බලපත්‍රයක් නිකුත් කිරීම සඳහා ඉල්ලුම් කිරීමට සුදුසුකම් ලැබිය යුතු ය."; සහ

(2) එහි (1අ) වන උපවගන්තිය ඉවත් කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 43 වන වගන්තිය සංශෝධනය කිරීම

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 43 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එහි (3) වන උපවගන්තිය ඉවත් කිරීමෙන්; සහ

(2) එහි (4) වන උපවගන්තියේ අතුරු විධානයේ-

(අ) "වැඩිදියුණු කරනු ලබන යම් අලුත් උත්පාදන පිරියතක් හෝ යම් පවතින උත්පාදන පිරියතක් පුළුල් කිරීම සම්බන්ධයෙන්" යන වචන වෙනුවට "යම් අලුත් උත්පාදන පිරියතක් සම්බන්ධයෙන් හෝ වැඩිදියුණු කරනු ලබන හෝ වැඩිදියුණු කරනු ලැබිය යුතු යම් පවතින උත්පාදන පිරියතක් පුළුල් කිරීම සම්බන්ධයෙන්" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(ආ) (අ) ඡේදයේ "උත්පාදන පිරියත පුළුල් කිරීමේ සැලසුමට අනුකූලව;" යන වචන වෙනුවට "උත්පාදන පිරියත පුළුල් කිරීමේ සැලසුමට අනුකූලව; හෝ "යන වචන ආදේශ කිරීමෙන්.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

**5.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.